# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2289/43 - 2022 ජූලි මස 22 වැනි සිකුරාදා - 2022.07.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මා විසින් අමාත්‍ය මණ්ඩලයෙහි අමාත්‍යවරුන් හා අමාත්‍යාංශ සංඛ්‍යාව ද එකී අමාත්‍යවරයන්ට විෂයයන් හා කාර්යයන් සහ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන පැවරීම ද නිශ්චය කර ඇති හෙයින් ;

විවිධ අමාත්‍යවරයන් භාරයේ පවත්නා විෂයයන්, කාර්යයන්, දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන මෙම නිවේදනයේ දිනයේ සිට මෙහි පහත දැක්වෙන ලේඛනයෙහි සඳහන් පරිදි පවත්නා බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යම් අමාත්‍යවරයෙකුට නිශ්චිතව පවරනු නොලැබූ සියලු විෂයයන් හා කාර්යයන් දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන ජනාධිපති වශයෙන් තවදුරටත් මා භාරයේ පවතිනු ඇත.

රනිල් වික්‍රමසිංහ,
ජනාධිපති.

2022 ජූලි මස 22 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.


1A - G 37120 — 381 (2022/07)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (*සම්බන්ධිතයි*)

**03. තාක්ෂණ අමාත්‍ය (*සම්බන්ධිතයි*)**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 8. සයිබර් ආරක්ෂණයට අදාළ සිද්ධීන් සම්බන්ධයෙන් සක්‍රීයව මැදිහත්වීම හා එවැනි සිද්ධීන් වැළැක්වීම.<br>9. ඩිජිටල් වෝහාරික පරීක්ෂණ සඳහා අවශ්‍ය කරනු ලබන තාක්ෂණික සහාය ලබාදීම.<br>10. ප්‍රමිතීන් පැනවීම සහ පරිපාලනය සම්බන්ධ කටයුතු<br>11. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කටයුතු<br>12. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුවිෂයයන්ට අදාළ කටයුතු<br>13. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**04. 04. කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් විෂයන්ට සහII වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම | 1. කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව<br>2. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය<br>3. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව<br>4. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br>5. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය<br>6. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව<br>7. සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය<br>8. ජාතික සමාජ සංවර්ධන ආයතනය<br>9. ග්‍රාම සංවර්ධන, පුහුණු හා පර්යේෂණ ආයතනය | • ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත (2005 අංක 34)<br>• ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත (1998 අංක 50)<br>• ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත (1941 අංක 24)<br>• ළමයින් සහ තරුණ තැනැත්තන් පිළිබඳ ආඥාපනත (1939 අංක 48)<br>• දිවි නැගුම පනත (2013 අංක 1)<br>• ජාතික සමාජ සංවර්ධන ආයතනය පනත (1992 අංක 41)<br>• සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත (1996 අංක 17) |

උපලේඛනය (*සම්බන්ධිතයි*)

**04. කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය** (*සම්බන්ධිතයි*)

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලු ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br><br>4. කාන්තා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම<br><br>5. රාජ්‍ය කටයුතුවලදී තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය සහ නියෝජනය වැඩි කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම<br><br>6. ගැටුම්වලින් හා දරිද්‍රතාවයෙන් විපතටපත් කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br><br>7. කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම සඳහා වන නීති හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම<br><br>8. ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කාන්තාවන්ට වෙනස් කොට සැලකීම වලක්වාලීම සඳහා පවත්නා නීති සංශෝධනය කර නව නීති හා ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම<br><br>9. කාන්තා මූලික ගෘහ ඒකක සවිබල ගැන්වීම සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම<br><br>10. කාන්තා හා ළමා කටයුතු වලට අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටුකරගැනීම<br><br>11. පෙර පාසැල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම | 10. සමාජ ආරක්ෂණ මණ්ඩලය<br><br>11. ආබාධ තැනැත්තන් සඳහා වන ජාතික සභාව<br><br>12. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය<br><br>13. සමාජ සේවා දෙපාර්තමේන්තුව<br><br>14. වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය<br><br>15. වකුගඩු අරමුදල | • ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත (1996 අංක 28)<br><br>• දිළිඳු සහන පනත (1985 අංක 32)<br><br>• නිවර්තන නිවාස ආඥාපනත (1907 අංක 05)<br><br>• දරිද්‍රතා නීති ආඥාපනත (1939 අංක 30)<br><br>• අයාල ආඥා පනත (1841 අංක 4)<br><br>• වැඩිහිටි තැනැත්තන් ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත (2000 අංක 9)<br><br>• දෘෂ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය භාර අරමුදල පනත (1992 අංක 9)<br><br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්. |

උපලේඛනය (*සම්බන්ධිතයි*)

**04. කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය** (*සම්බන්ධිතයි*)

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 12. ශාරීරික හා මානසික වශයෙන් නීරෝගී දරුවන් ඇති කරලීමේ අභිප්‍රායෙන් මුල් ළමා විය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම | | |
| 13. අනාරක්ෂිත තත්ත්වයේ සිටින දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර සම්මතයන්ට ගැලපෙන සේ වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම | | |
| 14. ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම | | |
| 15. ළමා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය කිරීම | | |
| 16. සෙවන සරණ කැපකරු මව්පිය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම | | |
| 17. සුවිශේෂී කුසලතා ඇති දරුවන් ගේ එම කුසලතා ඔප්නංවා ගැනීම සඳහා මූල්‍යාධාර සැපයීම | | |
| 18. සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම | | |
| 19. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අවශ්‍යතාවයන් හඳුනාගැනීම හා එම අවශ්‍යතා ඉටුකර දීම | | |
| 20. මහජන ආධාර යෝජනා ක්‍රම සමාලෝචනය කිරීම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම | | |
| 21. ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගීන්ට, ලාදුරු රෝගීන්ට, පිළිකා සහ තැලසීමියා රෝගීන්ට සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ට ආධාර ලබාදීම | | |
| 22. පවුල් උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම | | |

උපලේඛනය (*සම්බන්ධිතයි*)

**04. කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය** (*සම්බන්ධිතයි*)

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණපනත්* |
|---|---|---|
| 23. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් අන්තර්ජාතික වශයෙන් පිළිගනු ලබන සම්මුතීන් වලට අදාළ කටයුතු<br><br>24. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අදාළ ආයතන සමග සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br><br>25. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ජනප්‍රවාහය හා එක්ව කටයුතු කිරීමට හැකි වන සේ අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කිරීම හා අවශ්‍ය පහසුකම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br><br>26. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම<br><br>27. වයෝවෘද්ධ තැනැත්තන් රැකබලා ගැනීම, සමාජ සංවර්ධන කාර්යයන්හි වැඩිහිටියන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීම සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අවශ්‍ය පියවර ගැනීම<br><br>28. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br><br>29. II තීරුවෙහි දැක්වෙන සියලු ආයතනයන් අධීක්ෂණය කිරීම | | |